All Rights Reserved

Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

50 | S | I

Grade 10 - Diagnostic Test – August 2022
අනාවරණ පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2022 අගෝස්තු

කාලය : පැය 1
Time: 1 hours

Drama and Theater
නාට්‍ය හා රංගකලාව - I

Name: - ..... class: -..... Index no: - .....

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(01) වේදිකා නාට්‍ය අනෙකුත් කලාවන්ට වඩා සුවිශේෂී වන්නේ,
(i) සෘජු ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබීම
(ii) ගබඩා කර තබා ගත හැකිවීම
(iii) කාලය හා අවකාශය සීමා රහිතවීම
(iv) රූපරාමු සංස්කරණය කළහැකිවීම

(02) සාමූහිකව කටයුතු කිරීමේ හැකියාව වර්ධනය කරගත හැක්කේ,
(i) සංගීත පුටු තරහ මගිනි
(ii) රංග ක්‍රීඩා වල යෙදීමෙනි
(iii) ශ්වසන අභ්‍යාස මගිනි
(iv) ඇවිදීමේ අභ්‍යාස මගිනි

(03) දික්තල කාලගෝල නාට්‍යයට පදනම් වී ඇත්තේ,
(i) ජන කතාවකි
(ii) ඓතිහාසික කතාවකි
(iii) බෞද්ධ කතාවකි
(iv) ජනප්‍රවාදයකි

(04) නාට්‍ය හා රංග කලාවේදී ඉන්ද්‍රියන් පාලනය කර ගැනීමට ගෝවර වන අභ්‍යාසයකි.
(i) ශ්වසන අභ්‍යාස
(ii) සංවේදන අභ්‍යාස
(iii) කටහඬ අභ්‍යාස
(iv) ශිථිලකරණ අභ්‍යාස

(05) රංග භූමියේ ත්‍රිමාණ විකාශනයේදී අනුපිළිවෙල වන්නේ,
(i) ප්‍රොසීනියම් , කරලිය , තානායම් පොළ , කවිත
(ii) ප්‍රොසීනියම් , කරලිය , කවිත , තානායම් පොළ
(iii) කවිත , තානායම් පොළ , කරලිය , ප්‍රොසීනියම්
(iv) තානායම් පොළ , කවිත , කරලිය , ප්‍රොසීනියම්

පහත දැක්වෙන ඡායාරූපය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(06) ඉහත ඡායාරූපයේ දැක්වෙන නාට්‍ය දර්ශනය අයත්වන්නේ පහත කවර නාට්‍යයකටද?

(i) දික්තල කාලගෝල (ii) විකෘති

(iii) මනමේ (iv) කැලණිපාලම

(07) මෙම නාට්‍යයේ අධ්‍යක්ෂක වරයා වන්නේ,

(i) එදිරිවීර සරත්චන්ද්‍ර (ii) පුණ්‍යසේන ගුණසිංහ

(iii) ආර්.ආර්. සමරකෝන් (iv) සෝමලතා සුබසිංහ

(08) මෙම ඡායාරූපයේ දැක්වෙන ප්‍රවීණ රංගන ශිල්පිණිය කවුද?

(i) චාන්දනී සෙනවිරත්න (ii) රත්නාලාලනී ජයකොඩි

(iii) මැණිකේ අත්තනායක (iv) කෞශල්‍යා ප්‍රනාන්දු

(09) මෙම නාට්‍යයට පාදක වී ඇති ජාතක කතාව වන්නේ ,

(i) සඳකිඳුරු ජාතකය (ii) චුල්ල ධනුද්ධර ජාතකය

(iii) ඉල්ලිස ජාතකය (iv) උම්මග්ග ජාතකය

(10) කතාන්දර සම්බන්ධ වඩාත් ගැළපෙන වැකිය වන්නේ,

(i) කියවා රසවිඳිය හැකි සිද්ධි මාලාවක් සහිත ඇතැම්විට සංවාද ඇතුලත් දීර්ඝ කතා පුවතකි.

(ii) ලිඛිතව ලියනලද පිටපතකට අනුව සිද්ධි මාලාවක් හා සංවාද ඇතුලත් කතා පුවතකි.

(iii) තෝරාගත් අවස්ථාවක් හෝ සිද්ධියක් තේමා කරගත් ප්‍රබල පෙළක් සහිත සිද්ධි මාලාවකි.

(iv) සීමිත කාලයක් තුළ කියවා රසවිඳීම සඳහා නිර්මාණය වී ඇති කතා ප්‍රවෘත්තියකි.

(11) දෘශ්‍ය කලාවක් නොවන්නේ,

(i) චිත්‍ර (ii) කතාන්දර (iii) මූර්ති (iv) කැටයම්

(12) ශ්‍රව්‍ය දෘශ්‍ය ගණයෙහිලා නොගැනේ,

(i) චිත්‍රපට හා රූපවාහිනී නාට්‍ය (ii) වේදිකා නාට්‍ය හා බැලේ

(iii) චිත්‍ර හා රූපවාහිනී නාට්‍ය (iv) මුද්‍රා නාට්‍ය හා බැලේ

(13) නළුවෙකුගේ ප්‍රධාන ප්‍රකාශන මාධ්‍ය වන්නේ,

(i) නළුවාගේ රංගන හැකියාවයි (ii) නළුවාගේ සංවාදයයි

(iii) නළුවාගේ ශරීරයයි (iv) නළුවාගේ මුහුණයි

(14) නාට්‍ය ගණයෙහි ලා සැලකෙන්නේ,

(i) රංගනය මඟින් කිසියම් අදහසක් ප්‍රකාශ වන ඒවාය

(ii) රංගනය මඟින් කිසියම් අදහසක් හා භාවයක් ප්‍රකාශ වන ඒවාය

(iii) රංගනය මඟින් රිද්මයානුකූල අලංකාර බවක් ප්‍රකාශ වන ඒවාය

(iv) රංගනය මඟින් සතර අඟිනයම යොදා සිදුවීමක් ප්‍රකාශ වන ඒවාය

(15) E අක්ෂරයෙන් දැක්වෙන්නේ,

(i) පින්තූර රාමු වේදිකාවේ පහලවම

(ii) පිනතුර රාමු වේදිකාවේ ඉහලවම

(iii) ප්‍රොසීනියම් වේදිකාවේ ඉහළ දකුණ

(iv) ප්‍රොසීනියම් වේදිකාවේ පහළ දකුණ

D		
		E

(16) නාට්‍ය කලාවට වූ කලී සාමූහික කලාවකි. මෙම සාමූහික කාලව මෙහෙයවන පුද්ගලයා වන්නේ,
(i) නාට්‍ය අධ්‍යක්ෂවරයාය

(ii) පිටපත් රචකයාය

(iii)නළු නිලියන්ය

(iv)පෙළ මෙතක්කර දෙන්නන්ය

(17) " සතර අභිනය " යන්නට නොගැළපෙන ප්‍රකාශය කුමක්ද?
(i) වාචික , ආංගික , සාත්වික හා ආහාර්ය යන නම් වලින් හැඳින්වේ.

(ii) විශේෂයෙන් නාට්‍යයේදී යොදාගැනේ.

(iii)යුරෝපයේ බිහිවී පෙරදිගට සංක්‍රමණය වූ සංකල්පයකි.

(iv)මුල්වරට සාකච්ඡාවට භාජනය වන්නේ භරත මුණිගේ නාට්‍ය ශාස්ත්‍රයේය.

(18) සිංහබාහු/ මනමේ වැනි නාට්‍ය අයත් වන්නේ,
(i) ලෝකධර්මී සම්ප්‍රදායටය

(ii) විකාර රූපී සම්ප්‍රදායටය

(iii)නාට්‍ය ධර්මී සම්ප්‍රදායටය

(iv)ගීත නාටක සම්ප්‍රදායටය

(19) ආහාර්ය අභිනයට අයත් නොවන්නේ,

(i)	රංග රචනය - රංග වස්ත්‍ර	(ii)	සංගීතය - රංගාලෝකය
(iii)	රංග භාණ්ඩ - සංවාද	(iv)	රංග වස්ත්‍ර - පසුතල

(20) මුද්‍රා නාට්‍ය මීට අයත් වේ:

(i)	නෘත්‍ය ගණයට	(ii)	නෘත ගණයට
(iii)	ශෛලිගත නාට්‍යයටය	(iv)	ස්වභාවික නාට්‍යයටය

(21) නාට්‍යයක ගැටුම් අවස්ථා ඇති විය හැක්කේ,

(i) සමාන අදහස් ඇති අය නිසාය

(ii) පිටපතේ ඇති දැඩි සංවාද නිසාය

(iii) පරස්පර විරෝධී අදහස් නිසාය

(iv) නළු නිළියන්ගේ වැරදි ඉරියව් නිසාය.

- 22 සිට 25 තෙක් ප්‍රශ්න වලට නොගැළපෙන පිළිතුර තෝරන්න.

(22) නාට්‍ය අධ්‍යක්ෂකවරයා සතු කාර්ය වන්නේ,
(v) තම නාට්‍යයට සුදුසු නළු නිළියන් තෝරා ගැනීමය

(vi) නළු නිළියන්ගේ විනය පාලනය

(vii) නළු නිළියන් සමඟ නාට්‍ය පිටපත සාකච්ඡා කිරීමය

(viii) සංගීතය , රංගාලෝකය ආදී වූ අනුශංගික ශිල්පීන් මෙහෙයවීමය.

(23) නාට්‍යයක ගැටුමෙහි අරමුණ වන්නේ,

(i) ප්‍රේක්ෂකයා තුළ කුතුහලය දැනවීමය

(ii) ප්‍රේක්ෂකයා නොමහ යැවීමය

(iii) නාට්‍ය රසය නිර්මාණය කිරීමය

(iv) ප්‍රේක්ෂක අවධානය රඳවා ගැනීමය

(24) නාට්‍ය පිටපතකට අවශ්‍ය වන්නේ,

(i) කතාව මුල සිට අගට අනුපිළිවෙලින් ඉදිරිපත් කිරීමය

(ii) චරිතය

(iii) ගැටුම් අවස්ථාය

(iv) සංවාදය

(25) සම්මාරෝපය ,

(i) රංග භූමි පාලක සතු කාර්යයකි

(ii) නළුවෙකු තමාගේ පෞද්ගලිකත්වය අතහැර අනෙකෙකුගේ ස්වරූපය ගැනීම

(iii) බාහිර අභ්‍යන්තර වශයෙන් ප්‍රභේද දෙකකින් යුක්තය

(iv) සාර්ථක රංගනයක් සඳහා අත්‍යවශ්‍ය සාධකයකි.

මෙම ඡායාරූපය ඇසුරෙන පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



(26) ඉහත ඡායාරූපයේ සඳහන් නාට්‍යකරුවා කවුද?

(i) එදිරිවීර සරත්චන්ද්‍ර (ii) හෙන්රි ජයසේන

(iii) බන්දුල ජයවර්ධන (iv) පරාක්‍රම නිරිඇල්ල

(27) එම නාට්‍ය කරුවා විසින් නිර්මාණය කරන ලද ජනප්‍රිය නාට්‍යයක් වන්නේ,

(i) මනමේ (ii) සෙක්කුව

(iii) බෙරහඬ (iv) හුණුවටය

(28) නාට්‍ය කලාව පිළිබඳ වැරදි කියමන වන්නේ,

(i) විදග්ධ කලාවකි (ii) සාමූහික කලාවකි

(iii) සජීවී කලාවකි (iv) ශ්‍රව්‍ය දෘශ්‍ය කලාවකි

(29) යම් චරිතයක් හවුවේ මැනවින් නිරූපණය කිරීම පිණිස රූපණ ශිල්පියා

(i) රංග අභ්‍යාස රංග ක්‍රීඩා මැනවින් නිරූපණය කළ යුතුය.

(ii) මනා කඩවසම් හා රූමත් අයෙකු විය යුතුය.

(iii) පිටපත අධ්‍යයනය කර චරිතයේ භූමිකාව හඳුනාගත යුතුය.

(iv) තම පරිකල්පන හැකියාව මත චරිතයේ භූමිකාව වෙනස් කළ යුතුය.

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(30) කටහඬ හා වචන උච්චාරණ පුහුණුව සඳහා වඩාත් යෝග්‍ය ග්‍රන්ථ වන්නේ,

(i) ලෝවැඩ සඟරාව , ගුත්තිල කාව්‍ය (ii) මහා වංශය, ථූප වංශය
(iii) සුභාෂිතය , ගණදෙවි හැල්ල (iv) සකස්කඩ , බුද්ධ ගජ්ජය

(31) " භූමිකාව " යන්නෙන් හඳුන්වන්නේ,

(i) නාට්‍යයක ප්‍රධාන භූමිකාවයි (ii) නළුවා රඟපාන චරිතයයි
(iii) නළුවා හා නිළියගේ කාර්යයි (iv) චරිතය තුළ ඇති විවිධ පැතිකඩයි

(32) කාව්‍ය ශාස්ත්‍රය ග්‍රන්ථයේ කතෘ ලෙස සැලකෙන්නේ,

(i) ධනංජය (ii) භරතමුණි
(iii) ඇරිස්ටෝටල් (iv) විලියම් ශේක්ෂ්පියර්

(33) ලෝක ධර්මී නාට්‍ය වල පසුතල නිර්මාණ සිදු කරන්නේ,

(i) සැබෑ පසුතල මගින්ය.
(ii) වාචික අභිනය මගින්ය.
(iii) සංකේත භාණ්ඩ සහ පසුතල මගින්ය
(iv) චිත්‍ර වස්ත්‍ර මගින්ය.

(34) ශ්‍රී ලංකාවේ වැඩි වශයෙන් භාවිතා වන වේදිකා වර්ගය වන්නේ,

(i) පින්තූර රාමු වේදිකාව (ii) ජංගම වේදිකාව
(iii) ඇරිනා වේදිකාව (iv) ග්ලෝවේ රහමඩල

(35) වේදිකා නාට්‍යයකට නැතුවම බැරි දෙදෙනා වන්නේ,

(i) නිෂ්පාදක හා අංග රචනා ශිල්පියාය.
(ii) වේෂ භූෂණ හා අංගරචනා ශිල්පියාය.
(iii) නළුවා හා ප්‍රේක්ෂකයාය.
(iv) පෙළ රචකයා සහ අර්ථපතිය.

(36) නාට්‍යයක් සඳහා අවශ්‍ය නාට්‍යෝපකරණ අයත් වන්නේ,

(i) ආහාර්ය අභිනය (ii) වාචික අභිනය
(iii) අංගික අභිනය (iv) සාත්වික අභිනය

(37) " නාට්‍ය යනු සජීවී කලාවකි" යන්නට හොඳම හේතුවක් ලෙස ඔබ දකින්නේ,

(i) නළු නිළියන් රාශියක් රඟපෑමය.
(ii) ප්‍රේක්ෂක ප්‍රතිචාර සජීවී ලෙස ලැබීමය.
(iii) වේදිකාවක් භාවිතා කිරීමය.
(iv) විශාල ප්‍රේක්ෂක පිරිසක් එකවර නැරඹීමය.

(38) වෙනත් පුද්ගලයෙකුගේ චරිතයක් කර පෙන්වීම,

(i) අනුකරණය (ii) සමාරෝපය
(iii) අභිරූපණය (iv) ක්ෂණික නිරූපණය

(39) හිම කන්දක් දියවීමේ අභ්‍යාසය ලෙස සැලකෙන්නේ,

(i) ශිථීලකරණ අභ්‍යාසයක් ලෙසය (ii) රංග ක්‍රීඩාවක් ලෙසය
(iii) සාත්වික අභිනය ප්‍රගුණ කිරීමේ අභ්‍යාසයක් ලෙසය (iv) දර්පණ අභ්‍යාසයක් ලෙසය

(40) තමාගේ පරිපල්පන ශක්තිය මෙහෙයවා උත්පාදනය කරන වලන රටා හඳුන්වන්නේ,

(i) සවාභාවික වලන (ii) තලානුරූප වලන
(iii) නිර්මිත වලන (iv) රිද්මයානුකූල වලන

(ලකුණු 1x40=40)

සියලුම හිමිකම් ඇවිරිණි All Rights Reserved

Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

50 | S | II

Grade 10 - Diagnostic Test – August 2022
අනාවරණ පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2022 අගෝස්තු

කාලය : පැය 1
Time: 1 hours

Drama and Theater
නාට්‍ය හා රංගකලාව - II

Name: - ..... class: -..... Index no: - .....

II කොටස

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(1) පහත දැක්වෙන සංවාද ඛණ්ඩය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

කාලගෝල :- සත් අවුරුද්දක් මෙහෙකර ගත්තු මාගේ අඹු සිගිත්ත
සමඟ ආවේ ගමට යන්න මං
(මගෙ හාමුදුරුවො)
මේ හොර දිගාටුවා - ගහ ගැඹුරුයි කියලා
මහ ගජබින්න දොඩලා
මගේ අඹු රැගෙන පලා යන්න ගියේ මේ පේන්න

දික්පිටියා :- ඇත්තම.මේ කුරුම්ට්ටා
මෙහෙම කරයිදෝ කියලා - සිතුවේ නෑ මැණියම්පා මං
මගෙ හාමුදුරුවො - සිතුවේ නෑ මැණියම්පා මං
මේ කැත විහිළු කොටා අඹුගේ අත අල්ලා
ගත්විට දුවලා ගොස් මෙමා
ඇව බෙරගන්න - එනකොට දුන්න බැට මෙයා
මගෙ හාමුදුරුවො - එනකොට දුන්න බැට මෙයා

(i) මෙහි හාමුදුරුවෝ යනුවෙන් ආමන්ත්‍රණය කරන්නේ කාටද? (ල 2)
(ii) මෙහි මැණියන්ගේ නමින් දිවුරන්නේ කවුද? (ල2)
(iii)මෙම සංවාද කාණ්ඩය නාට්‍යයේ කුමන අවස්ථාවකට අයත් වූවක්ද ? (ල2)
(iv)මෙම නාටකය කතන්දරයෙන් වෙනස් වන්නේ කෙසේද? (ල2)
(v) මෙම නාටකයේ ප්‍රධාන ගැටුම කුමක්ද? (ල2)
(vi) එම ගැටුම විසඳන ආකාරය කෙටියෙන් දක්වන්න. (ල2)

(2) (i) අභිනය යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න. (ල2)
(i) සතර අභිනය නමකර කෙටියෙන් හඳුන්වන්න. (ල2)
(ii) රඟපෑම අර්ථවත් වීමට නළුවෙකුට සතර අභිනය උපයෝගි වන ආකාරය පහදන්න. (ල6)

(3) (i) රංග භූමියක් යනු කුමක්ද? (ල2)
(i) නූතන රංගභූමියේ මන:කල්පිත බෙදීම් ඇඳ නම් කරන්න. (ල4)
(ii) රංග භූමියක තිබිය යුතු ලක්ෂණ සාකච්ඡා කරන්න. (ල6)

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

(4) (i) රංග අභ්‍යාස හා රංග ක්‍රීඩා යනු කුමක්ද? (ල2)
(i) රංග අභ්‍යාස වර්ග 04ක් නම් කරන්න. (ල4)
(ii) නළුවෙකුට රංග අභ්‍යාස වැදගත් වන්නේ කවර හෙයින්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ල6)

(5)



(i) ඉහත රූපයේ දැක්වෙන නාට්‍යකරුවා කවුද? (ල2)
(ii) ඔහු හැරුණුකොට ගෙන වෙනත් නාට්‍ය අධ්‍යක්ෂවරු දෙදෙනෙක් නම් කර ඔවුන්ගේ නිර්මාණ එක බැගින් ලියන්න. (ල4)
(iii) ඉහත නාට්‍යකරුවාගෙන් නාට්‍ය කලාවට සිදු වූ සේවය විස්තර කරන්න. (ල6)

Name: .....

(6) (i) නාට්‍ය ශෛලිය යනු කුමක්ද? (ල2)
(i) භරතමුණිගේ නාට්‍ය ශාස්ත්‍රයට අනුව නාට්‍ය ශෛලිය බෙදෙන කොටස් නම් කර ඒ කෙටියෙන් හඳුන්වන්න. (ල4)
(ii) එම නාට්‍ය ශෛලීන් හි වෙනස් කම් සහර අභිනය ඇසුරින් දක්වන්න. (ල6)

(7) පහත දැක්වෙන කතා සැලැකිල්ල ඔබ කැමති අවසානයක් කරා ගෙන යමින් කෙටි නාට්‍ය පෙළක් රචනා කරන්න.
දික්පිටියා දික්තලා රැගෙන නිවසට යයි. නිවසේ දොරට තට්ටු කළ විට .....
(i) පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විදාන සමඟ සංවාද රචනා කිරීම සඳහා
(ii) චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථා ගොඩ නැගීම සඳහා
(iii) දෙගිඩියාව , කුතුහලය සහිත නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා

(මුළු ලකුණු 12x5=60)